*All Rights Reserved*

*Neertha LAW Academy - www.neertha.lk Neertha LAW Academy - www.neertha.lk Neertha LAW Academy www.neertha.lk Neertha LAW Academy - www.neertha.lk Neertha LAW Academy - www.neertha.lk Neertha LAW Academy - www.neertha.lk Neertha LAW Academy - www.neertha.lk Neertha LAW Academy - www.neertha.lk*

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය- 2023

**සාමාන්‍ය පොදු පරීක්ෂණය** | **12** | **S** | කාලය - පැය 02 යි.

**උපදෙස් :**

* **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

***ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**

* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.

* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති **අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.**

* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2),(3),(4),(5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර** තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පිටුපස** උපදෙස්වල දැක්වෙන පරිදි (X) **ක් යොදන්න.**

1.) ඉන්දියාව ඇතුළු යුරෝපිය රටවල මේ දිනවල පැතිරී යන නව කොවිඩ් ප්‍රභේදය කුමක්ද?

1. Omicron 2. JN 1 3. Alpha 4. BQ.1 5. XBB

2.) 2023 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූ රටවල් අනුපිළිවෙල මින් කුමක්ද?

1. ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, නවසීලන්තය, ඉන්දියාව
2. බංග්ලාදේශය, නවසීලන්තය, ඉන්දියාව, පාකිස්ථානය
3. ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව , ඉන්දියාව, නවසීලන්තය
4. ශ්‍රී ලංකාව, ඉන්දියාව, පාකිස්ථානය, ඕස්ට්‍රේලියාව
5. ඕස්ට්‍රේලියාව, පාකිස්ථානය, දකුණු අප්‍රිකාව, ස්පාඤ්ඤය

3.) ඉන්දියාවේ පළමු සූර්ය මෙහෙයුම හැඳින්වුයේ කවර නමකින්ද?

1. චන්ද්‍රයාන් 3 2. චන්ද්‍රයාන් 1 3. ආදිත්‍ය L1 4. ලූනා 25 5. ඕබිටර්

4.) 2023 වසරේ පැවති ලෝක රග්බි කුසලානය දිනා ගත් රට කුමක්ද?

1. නවසීලන්තය 2. දකුණු අප්‍රිකාව 3. ආර්ජන්ටිනාව 4. ස්පාඤ්ඤය 5. ප්‍රංශය

5.) හමාස් සංවිධානය ඊශ්‍රායිලයට මිසයිල ප්‍රහාර එල්ල කිරීමේදී ඊශ්‍රායිලය තුල ක්‍රියාත්මක නොවූ ආරක්ෂක පද්ධතිය කුමක්ද?

1. අයන් ඩෝම් Iron dome 2. ෆෝට්ට්‍රස් Fortress 3. අයන් ක්ලාඩ් Iron Clad 4. අයන් ලොක් Iron Lock 5. සිම්ප්ලිසේෆ් SimpliSafe

6.) වැඩිම චන්ද්‍රයන් ප්‍රමාණයක් ඇති ග්‍රහලෝකය වන්නේ මින් කුමක්ද?

1. සෙනසුරු 2. අඟහරු 3. බ්‍රහස්පති 4. බුධ 5. සිකුරු

7.) 2024 ජනවාරි 01 වනදා සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ නව Vat % බද්ද කොපමණද?

1. 18% 2. 19% 3. 15% 4. 12.5% 5. 17%

8.) උතුරු ඉන්දියාවට මෑතකදී බලපෑම් ඇති කල දරුණු සුළි කුණාටුව කුමක්ද?

1. මෝචා 2. මිජළම් 3. ඩෝරා 4. ඩැනියල් 5. ඉයන්

9.) “එක් තීරයක් එක් මාවතක් රාජ්‍ය නායක සමුළුව” “One Belt One Road” පසුගියදා පැවැත්වුයේ කුමන රටේද?

1. චීනය 2. ඉන්දියාව 3. කියුබාව 4. ජපානය 5. ඩුබායි

10.) පසුගියදා ශ්‍රී ලංකාවේ පැවති දැඩි නියං තත්ත්වය තුල ගොයන් කහ ගැන්වීමට හේතු වූ රෝගය හඳුන්වන්නේ කවර නමකින්ද?

1. ක්ලොරෝසිස් Chlorosis 2. කඩොපොර Cadophora 3. බ්ලැක් ස්පොට් Black Spot 4. නෙමටෝඩා Nematoda 5. එන්ට්‍රොබියාසිස් Enterobiasis

11.) 2017 වර්ෂයේ මාර්තු මස සඳුදා දිනක සඳරු තම උපන්දිනය සමරුවේය. ඔහු 2024 වර්ෂයේ උපන්දිනය සමරන්නේ කවර දිනයකදී ද?

1.සඳුදා 2.අඟහරුවාදා 3.බදාදා 4.බ්‍රහස්පතින්දා 5. සිකුරාදා

12.) පැයට කිලෝමීටර 60 වේගයෙන් ගමන් ගන්නා දුම්රියකට දුම්රිය මාර්ගය අසල තිබෙන කණුවක් පසු කිරීමට තත්පර 9ක් ගතවේ. දුම්රිය දිග කොපමණද?

1.15 m 2.150 m 3.15.5 m 4.1500 m 5. 1550m

13.) භාණ්ඩක් විකිණීමේදී එහි ලකුණු කළ මිලෙන් 8% වට්ටමක් දෙනු ලැබේ.විකුණූ මිල රුපියල් 368 ක් වන අතර භාණ්ඩයක ලකුණු කරන ලද මිල සොයන්න.

1.රු.400 2.රු.460 3.රු.500 4.රු.490 5. රු. 450

14.) දොඩම් ගෙඩි 2ක් සහ ඇපල් ගෙඩි 4ක මිල රුපියල් 1600කි. එම මුදලින් කෙනෙකුට තැඹිලි ගෙඩි 1ක් සහ ඇපල් ගෙඩි 6ක් මිලදී ගත හැකිය.පුද්ගලයෙකුට ඇපල් ගෙඩි 12ක් මිලදී ගැනීමට අවශ්‍ය නම්, ඔහු කොපමණ මුදලක් ගෙවිය යුතුද?

1.රු.1200 2.රු.2400 3. රු. 3600 4. රු.4800 5. මෙ කිසිවක් නොවේ

15.) පැයට කිලෝමීටර් 60ක වේගයෙන් ගමන් ගත් මෝටර් රියක් ගමන ගොස් ආපසු පැමිණියේ පැයට කිලෝමීටර් 30ක වේගයෙනි.එම මෝටර් රියේ සාමාන්‍ය වේගය සොයන්න.

1.43 km/hr 2.40 km/hr 3.45 km/hr 4.50 km/hr 5. 55 km/hr


16.) වාහන සංචිතයක වාහන 300ක් ඇති අතර එයින් 30%ක් ට්‍රක් රථ වේ. සංචිතයේ ඇති සියලු වාහන වලින් 20%ක් ඩීසල් වාහන වන අතර එයට ට්‍රක් රථ 15ක් ද ඇතුලත් වේ. සංචිතය ඇති වාහනවලින් ඩීසල් නොවන්නා වූ හා ට්‍රක් රථ නොවන්නාවූ වාහනවල ප්‍රතිශතය කොපමණද?

1.165% 2.65% 3.90% 4.55% 5. 155%

17.)පාසලක ගණිතය,භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව සඳහා ආසන පිළිවෙලින් 40%,50% සහ 75% කින් වැඩි කිරීමට යෝජනාවක් ඇත. වැඩිවන ආසනවල අනුපාතය කුමක්ද?

1. 2:3:4 2. 6:7:8 3. 6:8:9 4. 2:8:9 5.මේ කිසිවක් නොවේ

18.) ABCD යනු පැත්තක දිග මීටර් 6ක් වන සමචතුරස්‍රයකි. AE=1mද, HD= 2m ද EFGH සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය ABCD හි වර්ගඵලයෙන් 1/3ක් ද නම්, EF හි දිග?




1. 2.0 m 2. 3.5 m 3. 4.0 m 4. 5.0 m 5. 5.5 m

19.)පිළිවෙලින් රු.20000ක් හා රු.15000ක් ආයෝජනය කර A සහ B හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරති. මාස හයකට පසුව C රු.20000ක් සමග එම ව්‍යාපාරයට හවුල් විය. ව්‍යාපාරයෙන් වසර මුල සිට වසර 2ක් අවසානයේදී රු. 25000ක ලාභයක් ඉපයුවේ නම්, B ගේ කොටස කොපමණ වේද?

1. 7000/= 2. 7500/= 3. 4500/= 4. 8000/= 5. 8500/=

20.)පැයට කිලෝමීටර 5ක වේගයෙන් පයින් යන මිනිසකුට පාලමක් පසු කිරීමට විනාඩි 15ක් ගත විය. එම පාලමේ දිග සොයන්න.

1.1100 m 2. 1250 m 3. 1000 m 4. 1500 m 5. 1750m


21.) මව දියණියට වඩා අවුරුදු 12ක් වැඩිමහල් ය. අවුරුදු හතරකින් ඇගේ වයස දියණියගේ වයස මෙන් දෙගුණයකි. දියණියගේ දැන් වයස සොයන්න.


1.අවු.7 මාස 6 2.අවු.8 3.අවු.8 මාස 4 4. අවු.7 5. අවු.9 මාස 2


22.)එමී සහ සනී පැවරුමක් මත වැඩ කරමින් සිටිති. පරිගණකයක පිටු 32ක් ටයිප් කිරීමට එමීට පැය 6ක් ගතවන අතර සනීට පිටු 40ක් ටයිප් කිරීමට පැය 5ක් ගත වෙයි. පරිගණක දෙකක එකට වැඩ කරන ඔවුන්ට පිටු 110ක් ටයිප් කිරීමට කොපමණ කාලයක් ගතවේද?


1.පැය 7 මිනි.30 2.පැය 8 3.පැය 8 මිනි.15 4.පැය 8 මිනි.25 5. පැය 9


23.) පහත පතරම භාවිතයෙන් සෑදිය හැකි ඝනකය කුමක්ද?




1. 


2. 



3. 



4. 



5. 



24.)රූපය පෙන්වා ඇති කොටු දැලට ගැලපෙන කොටස තෝරන්න.


| | | | | |
|---|---|---|---|---|
| 20 | 19 | 18 | 17 | 16 |
| 31 | 28 | ? | 22 | 19 |
| 26 | 21 | 16 | ? | 6 |
| 26 | 22 | 18 | 14 | ? |

1. 


2. 



3. 



4. 



5. 



25 - 29

• පහත වෙන්රූප සටහන මත දී ඇති ප්‍රශ්න පදනම් වී ඇත.




 - Artist - චිත්‍රකරුවන්

 - Players - වාදකයින්

 - Doctors - වෛද්‍යවරුන්

25.)චිත්‍රකරුවන් හෝ වාදකයින් නොවන වෛද්‍යවරයන් සංඛ්‍යාව කීයද?
1. 22 2. 17 3. 8 4. 30 5.35

26.)වාදකයින් සහ චිත්‍රකරුවන් සංඛ්‍යාව කීයද?
1. 22 2. 25 3.17 4.30 5. 32

27.)වාදකයින් හෝ වෛද්‍යවරයන් නොවන චිත්‍රකරුවන් සංඛ්‍යාව කීයද?
1.25 2.30 3.22 4.15 5. 17

28.)චිත්‍රකරුවන් හා වාදකයින් යන දෙකම වන වෛද්‍යවරයන් සංඛ්‍යාව කීයද?
1. 4 2. 8 3. 3 4.17 5. 20

29.)චිත්‍රකරුවන් හෝ වෛද්‍යවරයන් නොවන වාදකයින් සංඛ්‍යාව කීයද?
1. 17 2. 22 3. 30 4.25 5. 32

30-31
•A,B,C,D සහ E යන ශිෂ්‍යයෝ පස්දෙනා විභාගයකට පෙනී සිටියහ. B ගේ ලකුණු වලට වඩා A ගේ ලකුණු අඩුවන අතර D ගේ ලකුණුවලට වඩා C ගේ ලකුණු වැඩි වේ. E ගේ ලකුණු B ගේ ලකුණු වලටත් D ගේ ලකුණු වලටත් වඩා අඩුවේ.

30.)ඉහත තොරතුරු ඇසුරින් අපෝහනය කළ හැක්කේ පහත දැක්වෙන කුමන ප්‍රකාශය ද?
1. C ගේ ලකුණු වලට වඩා E ගේ ලකුණු අඩුවේ.
2. C ගේ ලකුණු වලට වඩා B ගේ ලකුණු අඩුවේ.
3. C ගේ ලකුණු වලට වඩා A ගේ ලකුණු අඩුවේ.
4. A ගේ ලකුණු වලට වඩා D ගේ ලකුණු අඩුවේ.
5. A ගේ ලකුණු වලට වඩා E ගේ ලකුණු අඩුවේ.

31.)පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කුමක් නිවැරදි ද?

1. අඩුම ලකුණු ලැබූ ශිෂ්‍යයා හෝ වැඩිම ලකුණු ලැබූ ශිෂ්‍යයා හෝ නිර්ණය කළ නොහැකිය.
2. අඩුම ලකුණු ලැබූ ශිෂ්‍යා නිර්ණය කළ හැකි නමුත් වැඩිම ලකුණු ලැබූ ශිෂ්‍යා නිර්ණය කළ නොහැකිය.
3. වැඩිම ලකුණු ලැබූ ශිෂ්‍යයා නිර්ණය කළ හැකි නමුත් අඩුම ලකුණු ලැබූ ශිෂ්‍යයා නීරණය කළ නොහැකිය.
4. දෙවැනි වැඩිම ලකුණු ලැබූ ශිෂ්‍යයන් නිර්ණය කළ හැකිය.
5. අඩුම ලකුණු ලැබූ ශිෂ්‍යයා හෝ වැඩිම ලකුණු ලැබූ ශිෂ්‍යයා හෝ නිර්ණය කළ හැකිය.

NEERTHA LAW ACADEMY

32-34

• අංක 32,33 සහ 34 යන එක් එක් ප්‍රශ්නයෙහි A සිට F තෙක් නම් කරන ලද ප්‍රකාශ හය බැගින් දී ඇත. ඒවායින් තුනක් යම් පිළිවෙලකට සංවිධානය කළ හැකිය. ප්‍රකාශ තුන අඩංගු වරණය තෝරන්න.

32.)
A - නිහාල් උපාධිධාරියෙකි.
B - නිහාල් විධිමත්ව ක්‍රීඩා පුහුණුවීම් කරයි.
C - නිහාල් ක්‍රීඩාවල ප්‍රවීණයෙකි.
D - නිහාල් පාසලෙහි විද්‍යාව උගන්වයි.
E - නිහාල් ක්‍රීඩා වලට කැමති.
F - නිහාගේ මිත්‍ර රාදා ද ක්‍රීඩා වලට කැමති.

1.ABC 2.ADE 3.AEF 4.BEC 5.EBC

33.)
A - අර්ජුන ගුරුවරයෙකි.
B - අර්ජුනගේ පියා විශ්‍රාමලත් දුම්රිය ස්ථානාධිපතිවරයෙකි.
C - මම අර්ජුන සමග කැරම් ක්‍රීඩා කරමි. D - අර්ජුනගේ භාර්යාව කැරම් ක්‍රීඩාවට සමහරවිට අප හා එක්වේ එක්වේ.
E - සිරිතක් වශයෙන් මම සවස් භාගේ අර්ජුනගේ නිවසට යමි.
F - අර්ජුනකය පුතා කුඩා ළමයෙකි

1.AFB 2.BFA 3.CDE 4.ECD 5.FBA

34.)
A - සාවිත්‍රී සහ රම්‍යා ප්‍රාසාංගික කලාව කෙරෙහි උනන්දු වෙති.
B - සාවිත්‍රගේ පියා ලිපිකරුවකු වන අතර රම්‍යාගේ පියා ගුරුවරයෙකි.
C - සාවිත්‍රි ගායනයෙහි ද රම්‍යා රංගනයෙහිද දක්ෂ වෙති.
D - සාවිත්‍රගේ පියා හා රම්‍යාගේ පියා හොඳ මිතුරෝ වෙති.
E - රම්‍යාගේ පියා, සාවිත්‍ර දක්ෂ ගායිකාවක් වීම සඳහා උනන්දු කරවයි.
F - රම්‍යා හා සාවිත්‍රී පාසල් සංස්කෘතික වැඩසටහන්වලට සහභාගි වෙති.

1.DBE 2.BDF 3.ACF 4.ACE 5.ADB

35- 40

• අංක 35 සිට 40 තෙක් ප්‍රශ්න P,Q,R,S,Tහා U නමැති සය දෙනා නිරත වී සිටින රැකියා ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වන පහත තොරතුරු මත පදනම් වේ.

° මොවුන් සයදෙනා අතරින් දෙදෙනෙක්
නීති ක්ෂේත්‍රයද එක් අයෙක් පරිපාලන ක්ෂේත්‍රයේද රැකියාවල නිරත වී සිටිති.
° ව්‍යාපාරික ක්ෂේත්‍රයේම රැකියාවක නිරත P, විවාහ වී සිටින්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියාවක නිරත S සමඟ වේ.
° U නිරත රැකියා ක්ෂේත්‍රයේම රැකියාවක යෙදී සිටින Q, විවාහ වී සිටින්නේ පරිපාලන ක්ෂේත්‍රයේ රැකියාවක නිරත වී සිටින අය සමඟ වේ.
° මෙම පිරිසේ R ඇතුළුව හතර දෙනෙක් විවාහක අයවලුන් වෙති.
° මෙම පිරිසේ කාන්තාවන් සිටින්නේ දෙදෙනකු පමණි. එම දෙදෙනා නිරත රැකියා ක්ෂේත්‍ර වලට අයත් රැකියාවක නියුක්ත වෙනත් කිසිවෙකුත් මොවුන් සය දෙනා අතර නැත.

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ වර්ණය තෝරන්න.

35.)අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියාවක නිරත වූවකු වන්නේ මින් කවරෙක්ද?
1.Q 2.R 3.T 4.U 5. P

36.)විවාහක පිරිමියෙකු වන්නේ මින් කවරෙක්ද?
1.P 2.Q 3.S 4.T 5. R

37.)විවාහක කාන්තාවක් වන්නේ මින් කවරෙක්ද?
1.P 2.Q 3.S 4.T 5.R

38.)මෙම පිරිසේ සිටින කාන්තාවන් දෙදෙනා කවුරුහු ද?
1. P හා T 2. P හා Q 3. P හා R 4. Q හා T 5. Q හා R


39.)පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිශ්චිත වශයෙන්ම සත්‍ය වන්නේ කුමක්ද?
1. Q විවාහක කාන්තාවකි.
2. R විවාහක පිරිමියෙකි.
3. U අවිවාහක කාන්තාවකි.
4. T අවිවාහක පිරිමියෙකි.
5. S අවිවාහක පිරිමියෙකි.

40.)මෙහි පරිපාලන අංශයේ නියුතු බිරිඳ හෝ ස්වාමිපුරුෂයා කවරහුද?
1. R 2. Q 3.S 4.T 5. P

NEERTHA LAW ACADEMY

41-42

• පහත දැක්වෙන ප්‍රස්ථාර සටහනට අනුව අංක 41 සහ 42 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.




41.)ප්‍රස්තාරයේ නිරූපිත විචල්‍යයන් අනුව 2006 - 2011 දක්වා වැඩි ම වර්ධනයක් දක්නට ලැබෙන්නේ කුමන විචල්‍යයේද?

1. සේවා  2. කර්මාන්ත  3. කෘෂිකර්මාන්ත  4. සේවා සහ කර්මාන්ත  5. කෘෂිකර්මාන්ත සහ සේවා

42.)අදාළ කාලය තුළ එම විචල්‍යයෙහි වර්ධනය රුපියල් බිලියන කීයද?

1.බිලියන 2000
2.බිලියන 2250
3.බිලියන 2500
4.බිලියන 2750
5. බිලියන 3000

43-44

• අංක 43 හා 44 තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ A හා B වශයෙන් වූ ප්‍රකාශ දෙකක් හා එම ප්‍රකාශ පදනම් කරගෙන එළැඹිය හැකි යැයි අපේක්ෂිත එක හා දෙක වශයෙන් වූ නිගමන දෙකක් බැගින් දී ඇත.එම ඇතැම් ප්‍රකාශ ප්‍රායෝගිකව අසත්‍ය ලෙස පෙනී යා හැකි වුවත්, මෙහිදී ඒවා සත්‍ය ලෙස සැලකිය යුතු වේ.

දෙන ලද ප්‍රකාශ දෙක පමණක් පදනම් කරගෙන එම නිගමන අතුරින්,

° I හා II යන නිගමන දෙකකට නිශ්චිත වශයෙන්ම එළඹිය හැකි වන්නේ නම් අංක 1ද,
° I නිගමනයට පමණක් නිශ්චිත වශයෙන්ම එළඹිය හැකි වන්නේ නම් අංක 2ද,
° II නිගමනයට පමණක් නිශ්චිත වශයෙන්ම එළඹිය හැකි වන්නේ නම් අංක 3ද,
° I හෝ II යන කිසිදු නිගමනයකට එළඹිය නොහැකි වන්නේ නම් අංක 4ද
යන්න තෝරන්න.

43.) ප්‍රකාශය:
A - සමහර කාන්තාවන් ලස්සනය.
B - සමහර ශ්‍රී ලාංකිකයන් කාන්තාවන් නොවේ.

නිගමනය:
I - එම නිසා සමහර ශ්‍රී ලාංකිකයන් ලස්සනය.
II - එම නිසා සියලුම ශ්‍රී ලාංකිකයන් ලස්සන වේ.

1. 1  2. 2  3. 3  4. 4  5. **මේ කිසිවක් නොවේ**

44.) ප්‍රකාශය:
A - මිනිසුන් පස් දෙනෙක් එවරස්ට් නැග්ගාහ.
B - එවරස්ට් නගින්නෝ කඳු නගින්නෝය.

නිගමනය:
I - එම නිසා මිනිසුන් කඳු නගින්නෝය.
II - එම නිසා මිනිසුන් කඳු නගින්නෝ නොවෙයි.

1. 1  2. 2  3. 3  4. 4  5. **මේ කිසිවක් නොවේ**

45.) මෙම ප්‍රශ්නයෙහි A සිට I වාක්‍ය නිවැරදි පටිපාටියකට නොමැත.එම වාක්‍ය තර්කානුකූල අනුක්‍රමයක් ගොඩනැගීම සඳහා ඒවායේ වඩාත් ගැලපෙන පිළියෙල කිරීම තෝරන්න.

• ශ්‍රාවකයෙකු සහ නිවේදකයා අතර සංවාදය,
A - කවුද කතා කරන්නේ?
B - මම සමන්.
C - මම 11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබනවා.
D - ඔබ මොනවාද කරන්නේ?
E - ඔව්, මට ඇහෙනවා.
F - හලෝ, ඔබට මා කියන දේ ඇහෙනවද?
G - මේ ඔබ ඉල්ලූ ගීතයයි. ඔබට එය රස විඳින්න පුළුවන්.
H- ඔබ අසන්නට කැමති ගීතය මොකක්ද?
I - රෝජාමල් චිත්‍රපටියේ රෝජා රෝජා ගීතය.

1. ABDCGHIFE
2. FEABDCHIG
3.DCABGHFEI
4.HIFEABDCG
5. BDGIACEFH

46.) එක් ඡේදයක අනුපිළිවෙල වෙනස් කරන ලද වාක්‍ය තුනක් ඇතුළත් කෙටි ඡේද පහක් මේ දී ඇත. නිවැරදිව ගැලපූ පසු සිදුවීම් අනුපිළිවෙළින් දැක්වෙන ඡේදය තෝරන්න.

A - තමරා තම සෞඛ්‍ය ගැටළු විසඳා ගන්නේ ඖෂධ භාවිතයෙන් පමණි.දිනපතා ව්‍යායාම වල හා ඉක්මනින් ඇවිදීමේ යෙදෙන ලෙස වෛද්‍යවරයා තමරාට අවවාද කරයි.රෝග සුව කර ගැනීමේ ක්‍රමයක් ලෙස ඇය සංගීතයට සවන් දෙයි.

B - පොල් වත්තක වැඩ කරන කම්කරුවෙක් වල්පැළෑටි, පඳුරු හා අකුල් ඉවත් කිරීමෙහි යෙදේ.පොල් වත්තක වැඩ කරන කම්කරුවෙකුට දිනකට රුපියල් 800ක වැටුපක් ගෙවනු ලබයි. කම්කරුවා ලෙලි නොගසන ලද පොල් ගෙඩි දෙකක් රැගෙන ගෙදර යයි.


C - හිරු එළිය ප්‍රමාණවත් ලෙස නොලැබෙන නිසා නුගේගොඩ තට්ටු නිවාසයට ශෙහාන් කැමති නැත. කිරුළපන,නුගේගොඩ ප්‍රදේශවලින් තට්ටු නිවාසයක් මිලදී ගැනීමට ශෙහාන් පුවත්පත් දැන්වීම් බලයි. ශෙහාන්ගේ පුතා ගෘහභාණ්ඩ තම නිවසට ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන නියෝජිතයකු සම්බන්ධ කර ගනී.

D - නායකයා බවට පත් වූ උපනායකයාට ඔහුගෙ නායකත්වය හා කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීමේ හැකියාව තහවුරු කිරීමේ අභියෝගාත්මක වගකීම් පැවරී තිබේ.කාසිය වාසිය දිනීමෙන් පසු ශ්‍රී ලංකා කණ්ඩායම පන්දු රැකීම තෝරා ගත්තේය.පළමු පන්දුවට පහර දුන් කණ්ඩායම ඕවර 19.4 අවසානයේ ලකුණු 254ක් ලබා සියලු දෙනා දැවී ගියහ.

E - ඉරිදා පුවත්පත් මෙන් නොව දිනපතා පුවත්පත් සාමාන්‍ය රටවැසියාට මිලදී ගත හැකි මට්ටමක පවතී. රට පුරාම ඇති සිල්ලර අලෙවිසැල්වල ප්‍රවෘත්ති පත්‍ර විකිණීමට තබා ඇත.පුවත්පත් කියවීම සෑම ශ්‍රී ලාංකික රටවැසියකුගේම වැදගත් පුරුද්දක් බවට පත්ව ඇත.

1.A 2.B 3.C 4.D 5.E

47.) පහත දැක්වෙන පින්තූර මඟින් විස්තර කෙරෙන සිදුවීම සලකා බලන්න.




එම සිදුවීමෙහි නිවැරදි අනුපිළිවෙල දැක්වෙන්නේ පහත්ව සඳහන් කවර පිළියෙල කිරීම මගින්ද?

1.ACBFED
2.ADECBF
3.BECAFD
4.AEDCFB
5. CFBAED

48-50

• අංක 48 සහ 50 තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන සංවාදය මත පදනම් වේ.

පහත දැක්වෙන්නේ විදුලි මනු කියවන්නෙකු හා ගෘහ කාන්තාවක අතර ඇගේ නිවසේදී සිදුවූ සංවාදයක කොටස් වේ.

A- සුභ උදෑසනක්, මහත්මයාණෙනි. කරුණාකර කරගෙන යන්න.
B- සුභ උදෑසනක්, මහත්මියනි, විදුලි මනු කියවීම සඳහා මා ඇතුළට එන්නද?
C- මෙවර ගාස්තුව වෙනදාට වඩා වැඩි ඇයි?
D- ගාස්තුව වැඩිවී ඇත්තේ සහනදායි ඒකක සංඛ්‍යාව ඉක්මවා විදුලිය පාවිච්චි කර ඇති නිසයි.
E - ඔහුට කුමක් සිදු වෙලාද?
F - ඔහුගේ ශරීර උෂ්ණත්වය ඉහළ ගිහින්, නොකඩවාම උන තිබෙනවා.ඩෙංගු යැයි සැක කෙරෙනවා.
G - විදුලු මීටරය අවට අපවිත්‍රයි. මකුළුදැල් වලින් වැහිලා.
H - මනු කියවීම, ගෙවිය යුතු මුදල හා හිඟ මුදල් ඇත්නම් එය ඇතුලත් විදුලි ප්‍රකාශය මෙන්න.
I - කණගාටුයි. මගේ සහෝදරයා අසනීප වී රෝහල්ගත කිරීමට සිදුවූ නිසා මට වැඩ අධික වුණා. මට එතැන පිරිසිදු කරන්නට නොහැකි වුණා.
J - අනවශ්‍ය ලෙස දැල්වෙන විදුලි පහන් හැකිතාක් දුරට නිවා දමන්න ඕනෑ. විදුලිය පිරිමසින LED බුබුළු පාවිච්චි කරන්න ඕනෑ. සිවිලිම් පංකා ඇතුළුව විදුලිය වැඩියෙන් වැය කෙරෙන විදුලි උපකරණ පාවිච්චිය අඩු කරන්න ඕනෑ.
K- විදුලි පරිභෝජනය අඩු කළ හැකි ක්‍රම මොනවාද?
L- ඔබට ස්තුතියි!

48.)මෙම සංවාදයෙහි විදුලි මනු කියවන්නා විසින් ප්‍රකාශිත ප්‍රකාශ මොනවාද?
1.ADEGHJ
2.ADEHIJ
3.BDEGHJ
4.BDFGHJ
5. ABCDEF

49.)මෙම සංවාදයෙහි ගෘහ කාන්තාව විසින් ප්‍රකාශිත ප්‍රකාශ මොනවාද?
1.ACFIKL
2.ACHIKL
3.AFGIKL
4.BCFIKL
5. ABCDFH

50.)සංවාදයෙහි වඩාත් තර්කානුකූල අනුක්‍රමය තෝරන්න.
1.ABGIEFHCKJDL
2.ABHCGIEFDKJL
3.BAGIEFHCDKJL
4.BAGIHCEFFKJL
5. EFBCDGAHIJKL


2024
ඔබත්
උත්තරීතර
නීතිඥ වෘත්තියට
AFTER A/L
කලා/වාණිජ/විද්‍යා
ගණිත/තාක්ෂණවේදිය
නීතිඥයෙකු වන්න...
THE LAW
NEERTHA
LAW ACADEMY
www.neertha.lk
නීතිඥ
නිත් උදේශ
Page | 01


කලා/වාණිජ
විද්‍යා/ගණිත
තාක්ෂණවේදිය
නීති විද්‍යාලය ප්‍රවේශය
විවෘත විශ්ව විද්‍යාලය
(LLB ප්‍රවේශය)
නීතිඥ
වෘත්තිය
ලංකාවේ ප්‍රථමයා
එකම නීති පන්තිය
ආරම්භක සම්මන්ත්‍රණය නොමිලේ..
පෙබ. 03
සෙනසුරාදා
පෙ.ව. 8.30
නිව් ලීඩ්ස්
පානදුර
පෙබ. 05
සඳුදා
පෙ.ව. 8.30
නව මොන්ටානා
ගම්පහ
පෙබ. 08
බ්‍රහස්පතින්දා
පෙ.ව. 8.30
සෙයිලින් පෙන්
නුගේගොඩ
ONLINE පංතිය
පෙබ. 03 සෙනසුරාදා ප.ව. 7.00
www.Neertha.lk 2024 LLB&LC පංතියට ලියාපදිංචි වන්න.
A/L පොදු පරීක්ෂණය
විශේෂ සම්මන්ත්‍රණය
නොමිලේ
Neertha Law Academy
You Tube Live
0773 985 471
WhatsApp කරන්න.
පළමු දින නොමිලේ සහභාගී වීමට
0713 455095 Whats App කරන්න.
NEERTHA
LAW ACADEMY
නීතිඥ
නිත් උදේශ
0773 985 471 / 0774 481 487
Neertha Law Academy
www.neertha.lk
Page | 04